# බස්නාහිර පළාතේ පළාත් සභා රැස්වීම

## 2017 අගෝස්තු මස 22 වන අඟහරුවාදා

**බත්තරමුල්ල, ශ්‍රී ජයවර්ධනපුර, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ, අංක 204 හි පිහිටි**

**බස්නාහිර පළාත් සභා ගොඩනැගිලි සංකීර්ණයේ සභා ශාලාවේදී පවත්වන ලද රැස්වීම**

පූ.භා. 09.30 ට සභාව රැස් විය. ගරු සභාපතිතුමා මූලාසනාරූඪ විය.

**පැමිණීම :**

| | |
|---|---|
| ගරු සුනිල් විජේරත්න | (සභාපතිතුමා) |
| ගරු යසපාල කෝරලගේ | (නියෝජ්‍ය සභාපතිතුමා) |
| ගරු ඉසුර දේවප්‍රිය | (බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍ය, මුදල් හා ක්‍රමසම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බලශක්ති, පරිසර කටයුතු, ජලසම්පාදන හා ජලාපවාහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමා) |
| ගරු ගාමිණී තිලකසිරි | (බස්නාහිර පළාතේ කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග, ධීවර, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සහ ගොවිජන සංවර්ධන අමාත්‍යතුමා) |
| ගරු රංජිත් සෝමවංශ | (බස්නාහිර පළාතේ අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමා) |
| ගරු ලලිත් වනිගරත්න | (බස්නාහිර පළාතේ මාර්ග, ප්‍රවාහන, සමුපකාර සංවර්ධන හා වෙළඳ, නිවාස හා ඉදි කිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රාම සංවර්ධන අමාත්‍යතුමා) |
| ගරු සුමිත් ලාල් මැන්දිස් | (බස්නාහිර පළාතේ සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභ සාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා, කාන්තා කටයුතු සහ සභා කටයුතු පිළිබඳ අමාත්‍යතුමා) |
| ගරු සුනිල් ජයමිණී | (සභා නායකතුමා) |
| ගරු ලාලන් සුදත් මංජු ශ්‍රී අරංගල | (විපක්ෂ නායකතුමා) |
| ගරු ගුණසිරි ජයනාත් | (ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා) |
| ගරු යූ. ජෝර්ජ් පෙරේරා | (විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා) |

**ගරු මන්ත්‍රීවරු**

**ගරු මන්ත්‍රීවරු**

අනන්ද හරිස්චන්ද්‍ර ද සිල්වා
අනුරුද්ධ ලේකම්ගේ
අශෝක දයාරත්න
අමල් සිල්වා
අර්ෂාඩ් නිසාම්ඩීන්
ඇ. ශ්‍රීනාත් ම. පෙරේරා
ඉන්දික බණ්ඩාර
ඉෆ්තිකාර් ජෙමීල් මරික්කාර්
ඊ.ඒ. නන්දන පත්මකුමාර
උදාර රත්නායක
උදේන විජේරත්න
උපාලි කොඩිකාර
උපාලි ගුණරත්න
උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ
එම්.එස්.එම්. රහීම්
එස්. කුහවරදන්
එස්.එම්. සකාවුල්ලා
ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව
කාමල් කුරුප්පු
කීර්ති කාරියවසම්
කුරුසාමි කලන්කාඩි තේවර්
කේ.ඩී. අරුණ දීපාල්
ගමගේ නිහාල් ප්‍රේමශාන්ත පෙරේරා
චන්දන ජයකොඩි
ජගත් අංගගේ
ජගත් කුමාර
ජනක දීපාල් වැලිවත්ත
ජයන්ත ද සිල්වා
ඩෝල්ටන් ජානක සූරියබණ්ඩාර
තුවාන් ආමිත් මොහමඩ් අක්රම්
තෙබුවන පියනන්ද හිමි
නව්සර් ෆව්සි
නිමල් චන්ද්‍රරත්න
නිරෝෂා අතුකෝරල මැතිනිය
නිශාන්ත ශ්‍රී වර්ණසිංහ
පී.ආර්.පී. අබේගුණවර්ධන
පී.ඩී. අබේරත්න
බී.පී. ලක්ෂ්මන් ගුණවර්ධන
මහේෂ් අල්මේදා
මංජුල ප්‍රසන්න සම්පත්
මෙරිල් පෙරේරා
මොරිස් විජේරත්න
මොහොමඩ් ෆායිස්
යූ.එල්.එන්.පී. උඩවෙල
රජිත හපුආරච්චිගේ
රවීන්ද්‍ර යසස් කුමානායක
රොජර් සෙනෙවිරත්න
රොඩ්නි රුඩොල්ෆ් ෆ්‍රේසර්
රොයිස් විජිත
රෝස් ප්‍රනාන්දු මෙනෙවිය
ලක්ෂ්මන් නිපුණ ආරච්චි
ලයනල් ජයසිංහ
ලලන්ත ගුණසේකර
ලලිත් එල්ලාවල
ලලිත් වර්ණකුමාර
ලෙනාඩ් කරුණාරත්න
සරත් පතිරණ
සලෝචන ගමගේ
සහන් ප්‍රදීප්
සුනිල් වටගල
සුමිත් විජයමුණි ද සොයිසා
සුසිල් කිඳෙල්පිටිය
සෙනල් වෙල්ගම
සේනක දමයන්ත ද සිල්වා
ශිරන්ත අමරසේකර
ශ්‍රීනාත් පෙරේරා
හරිස්චන්ද්‍ර කොස්තා
හෙක්ටර් බෙත්මගේ

**නොපැමිණීම :**

**ගරු මන්ත්‍රීවරු**

අනුරාධ විමලරත්න
අසෝක රන්වල
ඇන්ටනී උපුල් රාජිත
එස්.ඒ. සමන්මලී සකලසූරිය මැතිනිය
කිත්සිරි කහටපිටිය
කොලන්නගේ වජිර පෙරේරා
කෝකිලා හර්ෂනී ගුණවර්ධන මැතිනිය
ජගත් පී. විතාන
ඩී.ඩබ්ලිව්. පුෂ්පකුමාර ද සිල්වා
නිමල් ආර්. පීරිස්
නිරෝෂ් ඩිල්ෂාන් ජයවර්ධන
නිරෝෂන් පාදුක්ක
නීල් සුනේත්‍රලාල් ප්‍රනාන්දු
ප්‍රදීප් උඳුගොඩ
ප්‍රදීප් පෙරේරා
මල්ෂා කුමාරණතුංග මැතිනිය
මහින්ද ජයසිංහ
මංජුල බුද්ධදාස
මොහොමඩ් ෆයිරූස්
රන්දීර් රොද්‍රිගෝ
රවී විජේසේකර
විජිත් ප්‍රියන්ත
සන්ධ්‍යා සිරිවර්ධන මැතිනිය
සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා
සුසාර දිනාල්

## 01. ආණ්ඩුකාරවරයාගෙන් ලැබෙන සංදේශ :

*"**විසි වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය නම් වූ පනත් කෙටුම්පත පිළිබඳව බස්නාහිර පළාතේ පළාත් සභාවේ අදහස් පිළිබඳ ප්‍රකාශනයක් අතිගරු ජනාධිපතිතුමන් වෙත වාර්තා කිරීමට හැකි වන පරිදි 2017.08.18 දින සිට දින 12 ක් ඇතුළත ගරු ආණ්ඩුකාරතුමා වෙත එවන මෙන් තමා වෙත දැනුම් දී තිබෙන බවත්, එකී පනත් කෙටුම්පතේ පිටපත් භාෂාත්‍රයෙන්ම අද දින ගරු මන්ත්‍රීවරුන්ගේ සභා මේසය මත තබා ඇති බවත් ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.**"*

## 02. කාරක සභා වාර්තා :

ගරු සභාපතිතුමා විසින් පහත සඳහන් කාරක සභා වාර්තා සභාවට පිළිගන්වන ලදී.

i. 2017.08.01 දින පැවැති මහජන පෙත්සම් කාරක සභා රැස්වීම් වාර්තාව සහ
ii. 2017.08.09 දින පැවැති සභා කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීම් වාර්තාව

***පූ.භා. 10.58 ට, ගරු සභාපති [සුනිල් විජේරත්න මහතා] මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු නියෝජ්‍ය සභාපති [යසපාල කෝරලගේ මහතා] මූලාසනාරූඪ විය.***

## 03. පළාත් සභාවේ රැස්වීම :

සුමිත් ලාල් මැන්දිස් ගරු සභා කටයුතු අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලද පහත සඳහන් යෝජනාව සභා සම්මත විය.

*"අද දින (2017.08.22) විසිර යෑමෙන් අනතුරුව මෙම සභාව, 2017.09.04 (සඳුදා) දින  දින පෙ.ව. 09.30 ට රැස් විය යුතු අතර, 2017.09.05 (අඟහරුවාදා) දිනය සභා රැස්වීම නොපැවැත්වෙන දිනයක් ලෙස සලකා ක්‍රියා කළ යුතු ය."*

## 04. පළාත් සභාවේ කටයුතු I :

සුමිත් ලාල් මැන්දිස් ගරු සභා කටයුතු අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලද පහත සඳහන් යෝජනාව සභා සම්මත විය.

*"අද දින පොදු කටයුතු ප්‍රමුඛතාවය ගත යුතු ය."*

## 05. 2017 අංක .... දරන පළාත් පාලන ආයතන බලතල ක්‍රියාත්මක කිරීම පිළිබඳ ප්‍රඥප්තිය : දෙවන වර කියැවීම

*"බස්නාහිර පළාතේ 2017 අංක ..... දරන පළාත් පාලන ආයතන බලතල ක්‍රියාත්මක කිරීම පිළිබඳ ප්‍රඥප්තිය" දෙවන වර කියැවීම සඳහා ඉසුරු දේවප්‍රිය - ගරු ප්‍රධාන අමාත්‍යතුමා විසින් පළාත් සභාවට ඉදිරිපත් කරන ලදී.*

## 06. 2017 අංක .... දරන බඩු උකස්ගන්නන්ගේ (සංශෝධන) ප්‍රඥප්තිය : පළමුවර කියැවීම

*"බස්නාහිර පළාතේ 2017 අංක ..... දරන බඩු උකස්ගන්නන්ගේ (සංශෝධන) ප්‍රඥප්තිය" පළමුවන වර කියැවීම සඳහා ඉසුරු දේවප්‍රිය - ගරු ප්‍රධාන අමාත්‍යතුමා විසින් පළාත් සභාවට ඉදිරිපත් කරන ලදී.*

*අනතුරුව හේමන්ත සමරකෝන් මහතා [සභා ලේකම්] විසින්,*

*එහි පූර්විකාව වූ,*

*"**2015 අංක 01 දරන බඩු උකස්ගන්නන්ගේ ප්‍රඥප්තිය සංශෝධනය කිරීම සඳහා වූ ප්‍රඥප්තියකි**" යනුවෙන් ප්‍රකාශ කරන ලදී.*

***අනතුරුව, ගරු නියෝජ්‍ය සභාපතිතුමා විසින් ප්‍රඥප්ති කෙටුම්පත ප්‍රඥප්ති හා නීති කාරක සභාවට යොමු කරන ලදී.***

## 07. **පෞද්ගලික මන්ත්‍රී යෝජනාව :**

නිරෝෂා අතුකෝරල ගරු මන්ත්‍රීතුමිය විසින් ඉදිරිපත් කරන ලද පහත සඳහන් යෝජනාව යූ. ජෝර්ජ් පෙරේරා විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා විසින් ස්ථිර කරන ලදී.

*"ශ්‍රී ලංකාවේ ජනගහනයෙන් 51% කට වැඩි ප්‍රමාණයක් කාන්තාවන් ය. එමෙන්ම ශ්‍රී ලංකාවේ ආර්ථිකයේ වැඩි බරක් උසුලන විදෙස්ගත ශ්‍රමිකයන් හරහා එන ධනයෙන් වැඩි පංගුව ගෙන එන්නේද කාන්තාවන්ය. තවද අතීත ශ්‍රී ලංකාව තුළ කාන්තාව මූලික කරගත් කාන්තාවටම වැඩි ගරුත්වයක් හිමිවන පරිද්දෙන් ගොඩ නැගුණු සාමාජ ආර්ථික වටපිටාවක් ද උරුම වී තිබුණි.*

*කරුණු එසේ වුවද වත්මන් ශ්‍රී ලංකාව තුළ කාන්තාවන්ට හා ළමුන්ට සිදුවන අපරාධ හා අඩත්තේට්ටම් ඉතා සීඝ්‍රයෙන් ඉහළ යමින් පවතී. කාන්තාවන් ඉලක්ක කර ගෙන සිදු වූ කොටකෙතන සමූහ ඝාතන සිදුවීම් ක්‍රියාදාමය ඊට ඇති ප්‍රබල උදාහරණයකි.*

***BBC** ලෝක සේවය මෑතදී කළ පරීක්ෂණ වාර්තාවකින් හෙළි වූයේ ශ්‍රී ලංකාවේ පොදු ප්‍රවාහන සේවයේදී කාන්තාවන් 75% ක් විවිධ අතවර වලට ලක්වන බවයි. තවද සේවා ස්ථානවලදී කාන්තාවන් ලිංගික හිරිහැර වලට පවා කෲර ලෙස සැලකීම් වලට ලක්වන අවස්ථා ඉතා විශාල ප්‍රමාණයක් වාර්තා වී ඇත. ශ්‍රී ලංකාව තුළ දරුවන්ට සිදුවන අපරාධ සඳහා කොටදෙනියාවේ සේයා සදෙව්මිණි දැරියගේ ඝාතනය ආදී උදාහරණ ඕනෑ තරම් ඇත.*

*මෙහිදී ඇති වැදගත් කරුණක් නම් කාන්තාවන්ට හා ළමුන්ට සිදුවන අපරාධ ප්‍රමාණය ඉතා ඉහළ අගයක් ගත්තද ඒවා වාර්තාවන ප්‍රමාණය අඩු වීමත් එම වාර්තා වන සිද්ධීන්ට එරෙහිව පියවර ගන්නා අවස්ථාවන් ඊටත් වඩා අඩු අගයක් ගැනීමයි. මේ සඳහා ඇති මූලිකම කාරණාව වන්නේ නීතිය ක්‍රියාත්මක කිරීමේ ඇති ප්‍රමාදය හා පොලිස් ස්ථානවලදී පැමිනිලිකරුවන්ට (අතවරයට ලක් වූ කාන්තාවන්ට) සිදුවන හිරිහැරයි. කාන්තාවන්ට හා ළමුන්ට සිදුවන අපරාධ හා අඩත්තේට්ටම් පිළිබඳ පැමිණිල්ල ලියා ගැනීමේ සිට පිරිමි පොලිස් නිලධාරීන් අභිමුව කටයුතු කිරීමේ දී කාන්තාවන්ට නැවත නැවතත් සිදුවන හිරිහැරයන් පිළිබඳව අමුතුවෙන් ප්‍රකාශ කළ යුතු නැත.*

*මේ සඳහා පිළියමක් ලෙස නියෝජ්‍ය පොලිස්පතිවරයෙකුගේ ඍජු අධීක්ෂණය යටතේ පාලනය වන කාන්තා පොලිස් නිලධාරිනියන්ගෙන් සමන්විත පොලිස් ස්ථානයක් සෑම දිස්ත්‍රික්කයකම පිහිටුවන ලෙස මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව රජයෙන් ඉල්ලයි."*

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***

*ඉහත නිරෝෂා අතුකෝරල ගරු මන්ත්‍රීතුමියගේ නමින් යුත් පෞද්ගලික මන්ත්‍රී යෝජනාවේ ඇති, "**BBC** ලෝක සේවය මෑතදී කළ පරීක්ෂණ වාර්තාවකින් හෙළි වූයේ ශ්‍රී ලංකාවේ පොදු ප්‍රවාහන සේවයේදී කාන්තාවන් 75% ක් විවිධ අතවර වලට ලක්වන බවයි." යන වචන ඇතුළත් වගන්තිය ඉවත් කරමින් යෝජනාව සංශෝධනය විය යුතු යැයි ආනන්ද හරිස්චන්ද්‍ර ගරු මන්ත්‍රීතුමා විසින් කරන ලද යෝජනාවට නිරෝෂා අතුකෝරල ගරු මන්ත්‍රීතුමිය එකඟත්වය පළ කරන ලදුව, ප්‍රශ්නය සංශෝධිතාකාරයෙන් සභාභිමුඛ කරන ලදී.*

***අ.භා. 12.28 ට, ගරු නියෝජ්‍ය සභාපති [යසපාල කෝරලගේ මහතා] මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු සභාපති [සුනිල් විජේරත්න මහතා] මූලාසනාරූඪ විය.***

**පළාත් සභා රැස්වීම : [විශේෂ]**

*විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය නම් වූ පනත් කෙටුම්පත සම්බන්ධයෙන් සාකච්ඡා කිරීම සඳහා පළාත් සභාවේ විශේෂ සභා රැස්වීමක් 2017.08.28 වන දින පැවැත් විය යුතු බව ගරු සභාපතිතුමා විසින් දුන් දැනුම් දීමට සභාවේද එකඟත්වය පළ වූ බැවින්,,*

***එකී පනත් කෙටුම්පත පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා මීට පෙර කිනම් තීරණයක් ගත්තද, රීති අංක 8(4) හි කෙසේ සඳහන් වුවද, මෙම පළාත් සභාව 2017.08.28 වන දින පෙ.ව. 10.00 ට රැස් විය යුතු බවට මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමා විසින් කරන ලද යෝජනාවට පළාත් සභාව එකඟ වූයෙන්, සභා සම්මත විය.***

***අ.භා. 12.58 ට, ගරු සභාපති [සුනිල් විජේරත්න මහතා] මූලාසනයෙන් ඉවත් වූයෙන්, හෙක්ටර් බෙත්මගේ ගරු මන්ත්‍රීතුමා මූලාසනාරූඪ විය.***

***ප්‍රශ්නය සංශෝධිතාකාරයෙන් විමසන ලදින්, සභා සම්මත විය.***

## 08. කල් තැබීමේ යෝජනාව :

*"මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රීති අංක 8(4) හි කෙසේ සඳහන් වුවද මෙම සභාව 2017.08.28 වන දින පෙ.ව. 10.00 දක්වා කල් තැබිය යුතු යැයි"* ගාමිණී තිලකසිරි ගරු අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සභා සම්මත විය.

***ඊට අනුකූලව, පළාත් සභාව අ.භා. 01.30 ට, 2017 අගෝස්තු මස 28 වන දින පූ.භා. 10.00 වන තෙක් කල් ගියේය.***

හේමන්ත සමරකෝන්,
ලේකම්,
බස්නාහිර පළාතේ පළාත් සභාව.

2017.08.22
බස්නාහිර පළාතේ පළාත් සභාව,
5 වන මහල,
බී පර්යන්තය,
සෙත්සිරිපාය,
බත්තරමුල්ල.
කුමා/22